**පෝෂණය වැඩිදියුණු කිරීම සඳහා පළාත් මට්ටමින් පෝෂණ මැදිහත්වීම් සඳහා වූ ශ්‍රී ලංකාවේ උතුරු පළාත් ව්‍යාපෘතියේ 2015 ජනවාරි 31 දිනෙන් අවසන් මාස 13 ක කාලපරිච්ඡේදය සඳහා**

---

පෝෂණය වැඩිදියුණු කිරීම සඳහා පළාත් මට්ටමින් පෝෂණ මැදිහත්වීම් සඳහා වූ ශ්‍රී ලංකාවේ උතුරු පළාත් ව්‍යාපෘතියේ 2015 ජනවාරි 31 දිනෙන් අවසන් මාස 13 ක කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපන් සමාජ සංවර්ධන අරමුදල අතර 2011 ජනවාරි 31 දින එළඹි අංක ටීඑෆ් 097171 දරන ප්‍රදාන ගිවිසුමේ 11 ව්‍යවස්ථාවේ 2.04 (ඇ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ප්‍රදාන ගිවිසුම අනුව , උතුරු පළාතේ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ , ගර්භණී හා කිරිදෙන මවුවරුන් සහ වයස අවුරුදු 5 ට අඩු ළමුන් අතර මන්ද පෝෂණ අනුපාතය අඩු කිරීම මඟින් ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ අවතැන්වූ ජනයාගේ ගෝලීය ආහාර හා මූල්‍ය අර්බුදවල සම්මිශ්‍රණය වූ බලපෑම් අඩුකර ලීමයි. ප්‍රදාන ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 300.5 කට සමාන එජඩො මිලියන 2.7 ක් වන අතර , ජපන් සමාජ සංවර්ධන අරමුදල මඟින් (ජේඑස්ඩීඑෆ්) ව්‍යාපෘතියේ සම්පූර්ණ පිරිවැය මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. 2011 ජනවාරි 31 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කර තිබුණු අතර 2015 ජනවාරි 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 ව්‍යාපෘති කාර්යයන්

---

**1 කොටස :- ක්ෂණික ආහාර සලාක සැපයීම**

---

ව්‍යාපෘතියේ ආරම්භක මාස 6 ක කාල පරිච්ඡේදය තුළ උතුරු පළාතේ ගම්වල අභ්‍යන්තරිකව අවතැන්ව ආපසු පැමිණි ජනයා සහ සත්කාරක පවුල් සමඟ ජීවත් වන අය ඇතුළත් පහත දැක්වෙන කණ්ඩායම් සඳහා ආහාර ශක්තිය හා ප්‍රෝටීන් (බත් සහ ඇට වර්ග ) වර්ධනය කිරීම සඳහා ක්ෂණික ආහාර සලාක සැපයීම.

(i) ඌන පෝෂිත ගර්භණී කාන්තාවන් සහ / හෝ ප්‍රමාණවත් බර ප්‍රමාණයක් නොමැති කාන්තාවන්

(ii) කිරිදෙන මවුවරුන් ( ප්‍රසූතියෙන් පසු මාස 6 ක් දක්වා )

(iii) සත් කාරක පවුල් සමඟ වෙසෙන පීඩාවට පත් වූ ගර්භණී කාන්තාවන් සහ කිරිදෙන මවුවරුන්

(iv) වැඩීම ඇණ හිටි , දුර්වල හෝ ඌන පෝෂිත ලෙස වර්ග කළ අවුරුදු 5 ට අඩු ළමුන් සහ

(v) සත් කාරක පවුල් සමඟ වෙසෙන පීඩාවට පත් ළමුන්

**2 කොටස :-** **ධාරිතා වර්ධනය හා ප්‍රජා සවලීකරණය**

---------------------------------------

ව්‍යාපෘතියේ ආරම්භක මාස 6 ක කාල පරිච්ඡේදය තුළ :-

(i) ළදරුවන්ට හා ළමුන්ට අදාළ ආහාරදීම හා රැකවරණ පුරුදු වර්ධනය කිරීම, ගර්භණී කාන්තාවන්ගේ පෝෂණය සහ ක්ෂුද්‍රපෝෂක අතිරේක ද්‍රව්‍ය ඇතුළත් කර ගැනීම සඳහා මූලික පෝෂණය , පෝෂණ චර්යා වෙනස්වීම සහ ප්‍රජා සවලීකරණයේදී ප්‍රජා ස්වේච්ඡා සේවකයන් , සෞඛ්‍ය සේවකයන් සහ ස්ත්‍රී කණ්ඩායම් වල සාමාජිකයන් බඳවා ගැනීම හා පුහුණු කිරීම.

(ii) බර කිරුම් කණු ( උස හා බර මැනීමේ උපකරණ සහ වර්ධනය අධීක්ෂණය කිරීමේ සටහන් ) සඳහා මූලික උපකරණ සැපයීම සහ හානි වූ බර කිරුම් කණු හා ප්‍රාදේශීය සායනවල කොටස් සඳහා සුළු අළුත් වැඩියා හා නවීකරණයන් සිදුකිරීම.

(iii) සංස්කෘතිකව අදාළ චර්යා වෙනස්වීමේ සන්නිවේදන ද්‍රව්‍ය සංවර්ධනය හා මුද්‍රණය කිරීම සහ

(iv) පෝෂණය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රජා සවලීකරණය.

**3 කොටස :-** **ප්‍රජා මූල පෝෂණ මැදිහත්වීම්**

-----------------------------------

එක් එක් දිස්ත්‍රික්කයේ ස්වේච්ඡා සේවකයන් , මහජන සෞඛ්‍ය සේවිකාවන් හා / හෝ ප්‍රාදේශීය සෞඛ්‍ය කාර්ය මණ්ඩලය මඟින් පහත දැක්වෙන දෑ සඳහා ප්‍රතිපාදනය

(i) මන්දපෝෂිත ගර්භණී හා කිරිදෙන මවුවරුන් සඳහා දැඩි චර්යා වෙනස්වීම පිළිබඳ උපදෙස් දීම.

(ii). මවුවරුන්ට හා අවුරුදු 5 ට අඩු ළමුන්ගේ භාරකරුවන් සඳහා වර්ධන අධීක්ෂණය සහ ප්‍රවර්ධනය

(iii). අවදානම් සහිත මවුවරුන්ට සහ ළමුන්ට අතිරේක ආහාර සැපයීම සහ නිවාස පරීක්ෂා කිරීම .

(iv). අදාළ පෝෂණ පුරුදු හා සෞඛ්‍ය වැදගත්කම ප්‍රවර්ධනය සඳහා ගර්භණී කාන්තාවන්ට සහ කුඩා ළමුන්ගේ මවුවරුන්ට චර්යා වෙනස්වීම පිළිබඳ සැසි සංවිධානය කිරීම. මෙම සැසි ස්වාමි පුරුෂයන්ට, නැන්දම්මාවරුන්ට හා යොවුන් ගැහැනු ළමුන්ටද ඉලක්ක වනු ඇත.

**4 කොටස :-** **ව්‍යාපෘති අධීක්ෂණය , නියාමනය , ඇගයීම හා උපදෙස්දීම**

---------------------------------------------------------

(i) පළාත් මට්ටමේ සිට දිස්ත්‍රික් හා ගම් මට්ටම දක්වා සුපරීක්ෂණයන් ඇතුළත්ව ව්‍යාපෘති කළමනාකරණ, සම්බන්ධීකරණ හා අධීක්ෂණ ක්ෂේත්‍ර වලදී ප්‍රතිග්‍රාහකයාට සහායවීම.

(ii) පෝෂණ ආරම්භයන් හා දිගු කාලීන පෝෂණ මැදිහත්වීම් පිළිබඳ අනුගමනය කරන වැඩ සටහන සඳහා සහාය වැඩි කිරීම සඳහා පළාත් සභාව විසින් උපදෙස්දීම හා සම්පත් සවලීකරණයට සහායදීම.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.5 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්ම වල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ.තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ජපන් සමාජ සංවර්ධන අරමුදල විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම් , මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදානවලින් කරන ලද මිලදී ගැනීම්

ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව,

(ඉ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල් , ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව,

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතින්වලට අනුකූල වූයේද යන බව,

**1.6 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

**---------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ විස්තර කෙරෙන කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**2.1 මතය**

**------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට, මා දරන්නාවූ මතය වනුයේ ,

(අ) 2015 ජනවාරි 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 ජනවාරි 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඉ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී ඇති බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

1978 සැප්තැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය හා 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑෆ්ජේ/2002/02 දරන මහා භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ව්‍යාපෘතිය විසින් රු.61,517,143 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද ස්ථාවර වත්කම් පිළිබඳ භෞතික පැවැත්ම පරීක්ෂා කිරීම සඳහා වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2015 ජනවාරි 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුම අනුව මූල්‍යනය සඳහා එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | |
|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | 2015 ජනවාරි 31 දක්වා | |
| | එ.ජ.ඩො. මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | එ.ජ.ඩො. මිලියන | රු.මිලියන |
| ප්‍රදාන නියෝජිතායතනය | 2.73 | 300.48 | 60 | 22.76 | 2.73 | 339.8 |
| | 2.73 | 300.48 | 60 | 22.76 | 2.73 | 339.8 |

**3.2 භෞතික ප්‍රගතිය**

උතුරු පළාතේ අවතැන් වූ ජනතාවගේ මන්ද පෝෂණය අඩු කිරීමේ අරමුණ ඉටුකර ගැනීම සඳහා ගර්භණී කාන්තාවන් 9,000 ක් හා කිරිදෙන මව්වරුන් 5,000 ක් හා වයස අවුරුදු 5 ට අඩු ළමුන් 11,000 ක් ඉලක්ක කර පෝෂක ආහාර (ජීවපෝෂ ) සැපයීම සඳහා ව්‍යාපෘතිය නිරතවී තිබුණි. එබැවින් ගර්භණී කාන්තාවන් 6,084 ක්, කිරි දෙන මව්වරුන් 5,404 ක් සහ ළදරුවන් හා ළමුන් 11,478 ක් සඳහා ව්‍යාපෘතිය යටතේ ආහාර සපයා තිබුණි.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලැබුණු තොරතුරු අනුව, ව්‍යාපෘතියේ අවසාන අදියරයන්හිදී වයස අවුරුදු 2 කට අඩු ළමුන් සඳහා පමණක් ආහාර සැපයීමට ව්‍යාපෘතිය තීරණය කර තිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස වයස අවුරුදු 2 සිට 5 අතර ළමුන් සඳහා ව්‍යාපෘතිය විසින් ආහාර ලබාදී නොතිබුණි.

(ආ) මූලායයන සැලැස්මේ ඇතුළත් නොවූ සහ එසේම ව්‍යාපෘතියේ අරමුණු වලට සෘජුවම සම්බන්ධ නොවූ මෝටර් වාහන , ග්‍රයින්ඩර්ස් (Grinders ) හා මුද්‍රිත ද්‍රව්‍ය ආදිය ප්‍රසම්පාදනය කිරීමේ කාර්යය සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 16.08 ක මුදලක් ව්‍යාපෘතිය විසින් වැය කර තිබූ බව නිරීක්ෂණය විය.

## 3.3 මතභේදයට තුඩුදෙන කරුණු

------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උතුරු පළාතේ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ කාර්යාලයේ වාහන සංචිතය මෝටර් වාහන 8 කින් සමන්විත වී තිබුණද, පෝෂණ මැදිහත්වීම් වැඩ සටහන් වැඩිදියුණු කිරීම සඳහා වෙන්කරන ලද ප්‍රදාන මුදල්වලින් 2014 ජුනි 30 දින රු.මිලියන 9.4 ක පිරිවැයකට වෑන් රථයක් ප්‍රසම්පාදනය කර තිබුණි.

(ආ) ව්‍යාපෘතිය විසින් ඖෂධ නිකුත් කිරීම් සඳහා යොදා ගැනීමට ලිපි කවර සැපයීම, මුද්‍රණය කිරීම හා ඒවා බැඳීම් සඳහා රු.මිලියන 1.39 ක මුදලක් වැයකර තිබුණද, පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ අයවැය ඇස්තමේන්තුවේ එවැනි වියදම් සඳහා වෙනම මුදල් වෙන්කර තිබුණි. කෙසේ වුවද ලිපි කවර බෙදාහැරීම හා අතැති තොගය සම්බන්ධයෙන් තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 3.4 නිෂ්කාර්ය / ඌන උපයෝජිත වත්කම්

--------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේදී රු.මිලියන 6.65 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද වැඩිහිටි උස හා බර මැනීම් උපකරණ 100 ක් හා ළමා උස හා බර මැනීම් උපකරණ 80 ක් ජීව වෛද්‍ය ඉංජිනේරුවන් විසින් අදාළ යන්ත්‍ර ක්‍රමාංකනය නොකිරීම හා එම විද්‍යුත් උපකරණ භාවිතා කිරීම සඳහා නිලධාරින් හුරුපුරුදු නොවීම ආදී කරුණු කිහිපයක් හේතුවෙන් වර්ෂ 02 ට වැඩි කාලයක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලවල උපයෝජනය නොකර පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 5.3 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල 23 කට නිකුත් කරන ලද මෝටර් ග්‍රයින්ඩර්ස් (Motor Grinders) 105 ක්, තෙකලා විදුලි පහසුකම් නොසැපයීම හේතුවෙන් අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගෙන නොතිබූ බව විගණන පරීක්ෂණයන්හිදී අනාවරණය විය. තවද එම උපකරණ ප්‍රසම්පාදනය කිරීමට පෙර ආහාර සකස් කිරීමේ කාර්යය සඳහා එම ප්‍රදේශවල අමු ද්‍රව්‍ය ලබාගැනීමේ හැකියාව පිළිබඳව ව්‍යාපෘතිය විසින් සලකා බලා නොතිබුණි.